කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13
2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි
(නව / පැරණි නිර්දේශය)

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රාසංගික කලා - PART E1025

ශ්‍රී ලංකාවේ යාතුකර්ම

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ප්‍රීණන සහ නාශක යාතුකර්ම එනමින් හැඳින්වීමට හේතු වූ පසුබිම් සාකච්ඡා කරන්න.

02. පත්තිනි දෙවඟන උදෙසා පවත්වනු ලබන ශාන්ති කර්ම හඳුන්වා ඉන් එක් ශාන්ති කර්මයක පත්තිනි දෙවියන් පුද පූජාවට ලක් වන අයුරු පැහැදිලි කරන්න.

03. සූනියම් ශාන්තිකර්මය පිළිබඳව පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
i උපත් කථාව සහ පූජා විධි රටාව
ii යක්ෂ හා දේව පද්ධතිය

04. ශාන්තිකර්මවලදී මානසික විශ්‍රාන්තියක් ලැබෙන්නේ කවර ආකාරයෙන් දැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න.

05. යාග භූමියක් ශුද්ධ භූමියක් (Sacred Ground) ලෙස සැලකෙනුයේ කවර හේතු නිසා දැයි පැහැදිලි කරන්න.

06. සශ්‍රීකත්වය සහ සාපල්‍යය තහවුරු කරනු වස් කොහොඹායක් කංකාරි ශාන්ති කර්මයෙහි උපයුක්ත පුදපූජා විධි අවස්ථා තුනක් විස්තර කරන්න.

07. රෝග නිවාරණය අරමුණු කරගනිමින් පහතරට ප්‍රදේශයේ පැවැත්වෙන **එක්** ශාන්ති කර්මයක පුදපූජා විධි රටාවෙහි විශේෂතා ඇගයීමට ලක් කරන්න.

08. සබරගමු ප්‍රදේශයට අයත් මඩු ශාන්තිකර්මවල අරමුණු, උපත් කථා සහ විශේෂ ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

*********************